// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2029/3 – 2017 ජූලි මස 24 වැනි සඳුදා – 2017.07.24**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/22/14/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.08.30 දිනැති හා අංක 1773/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අංගමුව, යාය 08, රාජාංගනය දකුණු ඉවුර හි පදිංචි ඩී.ජී.හේරත් බණ්ඩා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.07.10 දිනැති ප්‍රදානය පළ කරනු ලැබූ 2015.10.09 දිනැති හා අංක 1935/48 දරන ගැසට් නිවේදනය අවලංගු කර නව ප්‍රදානය ලෙස 2016.08.23 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩ බලන).

2017 ජුනි මස 28 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05,



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/22/14/2010.

කාර්මික අධිකරණයේ දීය.

ඩී.ජී. හේරත් බණ්ඩා මයා,රාජාංගනය දකුණු ඉවුර, යාය 08, අංගමුව.

*පැමිණිලිකාර පාර්ශ්වය*

*- එරෙහිව -*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

නඩු අංකය ඒ/3470.

සහ

සේවා යෝජක

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය,**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2012.08.09 වන දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

මා වෙත යොමු කර ඇති දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුල වනුයේ,

“ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තඹුත්තේගම කාර්යාලයේ ඉඩම් නිලධාරී ලෙස සේවයේ යෙදෙමින් සිටි ඩී.ජී. හේරත් බණ්ඩා මහතා හට හේතු දැක්වීමක් සිදු නොකර එම ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත ස්ථාන මාරු කිරීම යුක්තිසහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට හිමි විය යුතු හානි පූර්ණ දීමනා හා වෙනත් සහන මොනවාද යන්න පිළිබඳව වේ.”

"දෙපාර්ශ්වය විසින් තම තමන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් පසු මෙම ආරාවුල විමසීම සඳහා නියම කර කැඳවා සමථයක් කිරීම සඳහා සලකා බැලූ නමුත්, දෙපාර්ශ්වය එකඟතාවයකට නොපැමිණි හෙයින් විමසීම ආරම්භ කරන ලදී.

පළමු පාර්ශ්වය වන සේවක තැන තමා වෙනුවෙන් තමාම පෙනී සිටිමින් දිවුරුම් ප්‍රකාශයක් ගොනු කරමින් තම සාක්ෂි කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ඔහු වෙනුවෙන් වෙනත් සාක්ෂිකරුවෙක් කැඳවා නැත.

දෙවන පාර්ශ්වය වන සේවා යෝජක ආයතනය වෙනුවෙන් නීති නිලධාරී ලක්මාලි හඳුන් පතිරණ මහත්මිය මූලික වශයෙන් පෙනී සිට ඇති අතර, විමසීම සඳහා නීතිඥ ආශා හෙට්ටිආරච්චි මහත්මිය පෙනී සිටිමින් සාක්ෂිකරුවකු ලෙස ආයතනයේ පරිපාලන නිලධාරී සාක්ෂියට කැඳවා ඇත.

දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන ලද සාක්ෂි හරස් ප්‍රශ්න වලට භාජනය වූ අතර, සාක්ෂි අවසන් කිරීමෙන් පසු ලිඛිත දේශන ද, ඉදිරිපත් කර ඇත. සියළුම සාක්ෂි ලේඛන හා දේශන ද මා විසින් පරීක්ෂා කරන ලදී.

මා වෙත කරන ලද යොමු කිරීමේ ප්‍රධාන කාර්යාලයට මාරු කරන ලද දින වකවානු සම්බන්ධයෙන් සඳහනක් නැත. ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීමේදී පෙනී යන්නේ ක්ෂේත්‍ර නිලධාරියෙකු වශයෙන් සේවයේ යෙදී සිටි සේවක තැන වහාම ක්‍රියාත්මක වන පරිදි 2008.11.07 වන දින දරන ලිපියෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට රාජකාරි කිරීමට හැකි වන පරිදි ස්ථාන මාරු කරමින් 2008.11.10 වන දින සිට ප්‍රධාන කාර්යාලයේ විධායක අධ්‍යක්ෂ (පාලන හා මුදල්) වෙත සේවයට වාර්තා කරන ලෙස දන්වා ඇති බවයි. එමෙන්ම සේවක විසින් මෙම නඩුවට ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශයට අනුව, ඔහු 2009.03.01 වන දිනට රාජකාරි වාර්තා කිරීම සඳහා මහවැලි කුරුළු පෝෂිතයට යොමු කර ඇති බවත්, ඔහුට නේවාසික පහසුකම් ලබා දී ඇති බවත්, පෙනී යයි.

මෙම නඩුවේදී විමසීමට ලක්කල යුතුව ඇත්තේ හේතුවක් නොදන්වා පළමු පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය ප්‍රධාන කාර්යාලයට මාරු කිරීම යුක්තිසහගත වන්නේ ද යන්නත්, නැතහොත් ඔහුට හිමිවිය යුතු හානි පූර්ණය කොපමණද යන්නය. සේවක විසින් ඉදිරිපත් කර ඇති ලේඛනවල සඳහන් කර ඇති ඉල්ලීම්වලට අනුව සේවය සඳහා පැමිණීමේ ගමන් ගාස්තු යැපීමේ දීමනා, ගෙවල් කුලී හා 25% දීමනාව සඳහා ඔහු හිමිකම් පාන බව සඳහන්ව ඇත.

මෙම නඩුවේදී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව. මහවැලි අධිකාරිය විසින් ස්ථාන මාරු කිරීම් සම්බන්ධව ගෙවීම් කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ සඳහන් ප්‍රතිපාදනයන්ට අනුව බව සඳහන් කරන ලද අතර, සේවක විසින් ද ඒ බව පිළිගෙන ඇත. දෙවන පාර්ශ්වය විසින් R/02 ලෙස එකී ලේඛනය මෙම නඩුවට ගොනු කර ඇත.

කෙටි කාලයක් ඇතුළත මාරු කිරීම සම්බන්ධයෙන් අදාළ උප වේශන දීමනා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 24 වගන්තියේ දක්වා ඇත. සේවක විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද ලේඛනවල සඳහන් දීමනා සම්බන්ධයෙන් ඒවා ගණනය කර ඇති ආකාරය පිළිබඳ අනුගමනය කර ඇති පිළිවෙත කුමක් ද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් කර නැතිවා සේම එකී ලේඛන තහවුරු කිරීමක්ද කර නොමැති හෙයින් එකී ලේඛන පිළිගත නොහැක. පළමු පාර්ශ්වය වන සේවක විසින් තම සාක්ෂියේදී දීමනා හා ගමන් වියදම් ආදිය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය අනුගමනය කරන බව පිළිගෙන ඇති නිසාත්, දෙවන පාර්ශ්වය වන සේවා යෝජක විසින් තම ආයතනය විසින් අනුගමනය කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ සඳහන් ප්‍රතිපාදන බව පිළිගෙන ඇති නිසාත්, විමසීමට ඇති කරුණ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් ප්‍රතිපාදන අනුගමනය කිරීම සුදුසු බව මගේ විශ්වාසයයි.

සේවකයාට ලබා දී ඇති ස්ථාන මාරුව සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය වන සේවා යෝජක තැනගේ ස්ථාවරය වන්නේ පළමු පාර්ශවයට ලබා දී ඇති ස්ථාන මාරුව සේවයේ අවශ්‍යතාවය මත ලබා දී ඇති බවයි. එය කෙසේ වුවත්, ආයතන සංග්‍රහයේ 24 වන වගන්තිය යටතේ කෙටි කල් දීමක් ඇතිව මාරු කිරීමකදී සේවකයෙකුට හිමිකම් පෑ හැකි දීමනා සම්බන්ධයෙන් දක්වා ඇත. මෙකී සේවක තැනට 2008.11.07 වෙනි දිනැති ස්ථාන මාරුවීමේ ලිපිය මඟින් 2008.11.10 වෙනි දින සේවයට වාර්තා කරන ලෙස දන්වා ඇත. ඒ අනුව සේවක තැනට මාරු වීමේ දැන්වීම, දින ලිත් මාසයකට අඩු කල් දීමක් කොට මාරු කිරීම කර ඇති බව පැහැදිලිය.

ඔහු විසින් මෙම නඩුවට ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශයේ තමාට සිදුවී ඇති හානි පූර්ණය සම්බන්ධයෙන් නිශ්චිත ගණනය කිරීමක් දක්වමින් ඉල්ලීමක් කර නැත. එකී දිවුරුම් ප්‍රකාශය සමඟ සේවක විසින් ඔහුට හිමිවිය යුතු බවට කියමින් ඔහු විසින්ම පිළියෙල කරන ලද ගණනය කිරීම දක්වන ලේඛන කිහිපයක් අමුණා ඇත. එකී ලේඛන කිසිවක් යථා පරිදි තහවුරු කර නැත, මෙම ලේඛනවලට අනුව 2008, 2009 හා 2010 වර්ෂ සඳහා ඔහුට හිමිවිය යුතු දීමනා සම්බන්ධයෙන් සටහන් කර ඇති අතර, එම මුදල රු. 6,04,700.00 ලෙස බව සටහන් කර ඇත. එකී ලේඛන පිළිගත නොහැක. මා වෙත ඇති යොමු කිරීමට අනුව, සොයා බැලීමට ඇත්තේ 2008.11.07 වෙනි දින ලිපිය මඟින් ප්‍රධාන කාර්යාලයට මාරු කිරීම සම්බන්ධයෙන් හිමිවිය යුතු හානි පූර්ණ දීමනා හා වෙනත් සහන සම්බන්ධයෙන් ය.

මෙම නඩුවට අදළ සේවක ප්‍රධාන කාර්යාලයට මාරු කිරීමේ දී සේවා යෝජක විසින් ලිත් මාසයක කල් දීමක් කර ස්ථාන මාරු කර නැත. ඒ අනුව ඉහතින් සඳහන් කල පරිදි ලිත් මාසයක කල් දීමක් නොකර ස්ථාන මාරු කිරීමකදී සේවකයෙකුට හිමිවිය යුතු දීමනා උප වේශන දීමනා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 24 වගන්තියේ දක්වා ඇත. ඒ අනුව මෙම සේවකට එකී වගන්තියේ සඳහන් ප්‍රතිපාදනයන්ට අනුකූලව යැපීම් හා උප වේශන දීමනා හිමිවිය යුතු බවට නිගමනය කරමි. ස්ථාන මාරුවක් සම්බන්ධයෙන් සළකා බැලීමේදී මෙම සේවකට මාසයක් සඳහා දීමනා ලැබීමට හිමිකම් ලබයි. ආයතන සංග්‍රහයේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව ස්ථාන මාරුවකදී මෙම සේවකට, දින 30 ක කාලයක් සඳහා යැපීම් හා උප වේශන දීමනාව හිමිවිය යුතුය.

යැපීම් දීමනා 500 1/2 x උපවේශන දීමනා 25% කුත් හිමිවිය යුතුය.
උපවේශන දීමනාව රු. 250 x 30 = රු. 7500/- කුත්,
යැපීම් දීමනාව 7500 x 25/100 = රු. 1875/- කුත්,

වශයෙන් රු. 9375/- කුත් හිමිවිය යුතු බවට නිගමනය කරමි.

මෙම මුදල සේවකට ලබා ගැනීමට හැකි වන පරිදි කොළඹ 05, නාරාහේන්පිට, කම්කරු මහලේකම් කාර්යාලයේ, මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය භාර කම්කරු කොමසාරිස් වෙත මෙම නියෝගය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී, දින 30 ක් ඉක්ම යාමට ප්‍රථම තැන්පත් කරන ලෙසට පාර්ශ්වයට මෙයින් නියෝග කරමි.

මෙය යුක්තිසහගත හා සාධාරණ නියෝගයක් බවට විශ්වාස කරමින් මෙම ප්‍රදානය නිකුත් කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2016. 08. 23

08-247

මගේ අංකය: IR/19/04/2011.

## කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.01.16 දිනැති හා අංක 1793/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.01.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බදුල්ල, මහියංගන පාර, අංක 97/1හි පදිංචි ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ආදිපාදි වීදිය, අංක 11හි පිහිටි හලාවත වැවිලි සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කරු කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමුකරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.07.21 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩ බලන)

2017 ජූලි මස 13 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

යොමු අංකය: IR/19/04/2011

### කාර්මික අධිකරණය

.

ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා,
අංක 97/1,
මහියංගන පාර,
බදුල්ල.

නඩු අංක: ඒ - 3485

සහ

.

හලාවත වැවිලි සමාගම,
අංක 11,
ආදිපාද වීදිය,
කොළඹ 01.

### ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරවුල බේරුම් කිරීම මගින් නිරවුල් කිරීම පිණිස 2013.01.08 වන දින මා පත් කර ඇති අතර 2013.01.11 වන දින දරන ලිපිය මගින් එකී ආරවුල මා වෙත යොමු කර ඇත.

පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරවුල සඳහා හේතු වී ඇත්තේ

හලාවත වැවිලි සමාගමේ සේවයේ නියුතුව සිටිය දී ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මහතාගේ සේවය අත්හිටුවීම, විනය පරීක්ෂණයක් පවත්වා තීරණ ගැනීම සඳහා මාස 18ක කාලයක් ගත වීම හේතුවෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න හා එසේ වූයේ නම් එම කාලය සඳහා අදාළ හිඟ වැටුප් කම්කරු දීමනා හා කොටස් ලාභ දීමනා ඔහුට හිමි විය යුතුද නැතහොත් ඔහුට හිමි විය යුතු වෙනත් සහන මොනවාද යන්න පිළිබඳව වේ.

පාර්ශවකරුවන් විසින් තමතමන්ගේ ප්‍රකාශ ද ඉදිරිපත් කිරීමෙන් පසු මෙම ආරවුල විමසීම සඳහා නියම කොට කැඳවා ඇත.

පළමු පාර්ශවය තමා වෙනුවෙන් තමාම පෙනී සිටින ලද අතර දෙවන පාර්ශවය වෙනුවෙන් නීතිඥ ටිරෝන් වීරක්කොඩි මහතා පෙනී සිට ඇත. මෙම නඩුවේ විමසීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර, සමථයක් කිරීමට හැකියාව තිබේදැයි සලකා බලන ලද මුත් දෙපාර්ශවය අතරේ සමථයක් ඇති කරලීමට නොහැකි වූයෙන් විමසීමේ කටයුතු ආරම්භ කරන ලදී.

පළමු පාර්ශවය විසින් තමාගේ මූලික සාක්ෂිය ඉදිරිපත් කරමින් A 1 සිට A 30 දක්වා ලේඛන ලකුණු කරන ලදී. දෙවන පාර්ශවය විසින් ඔහුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. පළමු පාර්ශවයේ ඉල්ලීම පරිදි ඔහු විසින් ලකුණු කරන ලද ලේඛන සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා දෙවන පාර්ශවය වන සේවා යෝජක ආයතනයේ සේවය කරන කළමනාකරු මානව සම්පත් පරිපාලන නිලධාරි අතපත්තු මුදියන්සේලාගේ තිස්ස හේමන්ත අතපත්තු සාක්ෂිකරුවෙකු ලෙස කැඳවා සාක්ෂි විමසන ලදුව ඔහු ද හරස් ප්‍රශ්නවලට භාජනය වී ඇත. දෙවන පාර්ශවය වෙනුවෙන් සාක්ෂිකරුවන් කැඳවීමක් නොකරන බව ප්‍රකාශ කරමින් R 1 සිට R 4 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කර ඇත. දෙපාර්ශවය විසින්ම ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. දෙපාර්ශවයේ දේශන, ලේඛන හා සාක්ෂි මා විසින් පිරික්සා බලන ලදී.

පළමු පාර්ශවය විසින් කියා සිටිනු ලබන්නේ කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව ඔහුගේ සේවය තහනමට ලක් කර, විනය පරීක්ෂණ පවත්වා තීරණ ගැනීම සඳහා මාස දහ අටක කාලයක් ගතවීම හේතුවෙන් ඔහුට බලවත් අගතියක් සිදුවී ඇති බවත්, එකී කාරණය මත තමාට එම කාලය තුළ අයවිය යුතු පසු වේතන, කම්කරු දීමනා හා කොටස් ලාභ ලබා ගැනීමට අයිතියක් ඇති බවය. දෙවන පාර්ශවය විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින්,මාස දහ අටක කාලයක් ගතවීමට හේතු වූයේ පළමු පාර්ශවයේ ක්‍රියාකාරීත්වය හේතු කොටගෙන බවත්, ඒ සඳහා වගකීම දැරිය යුත්තේ ඔහුම බවත්, ඔවුන් නිසි පරිදි විනය පරීක්ෂණ කටයුතු කිරීම ආරම්භ කළ බවත් කියා සිටී.

ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීමේ දී පහත සඳහන් කරුණු පැහැදිලි වේ. 2003.09.08 වන දින සිට සේවය තහනමට ලක් වී ඇති බවත්,2003.09.25 වන දින චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇති බවත්, 2003.09.29 වැනි දින නිදහසට කරුණු ඉදිරිපත් කර ඇති බවත් 2003.10.07 දිනැති ලිපිය මගින් ඔහුගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම පිළිගත නොහැකි බැවින් 2003.12.16 දිනට විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව දන්වන ලද බවත් නැවත 2003.11.16 වන දිනට පරීක්ෂණය නියම කරන ලද බවත් 2003.11.28 දිනැති ලිපිය මගින් තමා අසනීපයෙන් සිටින බව දන්වා පළමු පාර්ශවය විසින් විමසීම සඳහා වෙනත් දිනයක් ඉල්ලා සිටින ලද බවත් දෙපාර්ශවය විසින්ම පිළිගෙන ඇති කරුණු වේ.

තව ද පළමු පාර්ශවය විසින් සහන පතා 2003.11.07 දිනැතිව කම්කරු විනිශ්චය සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර 2003.12.09 වන දින උත්තර ප්‍රකාශ ඉදිරිපත් කර කැඳවීම සඳහා 2004.02.12 දිනට නියම කර ඇති බවත්, එකී නඩුවේ වග උත්තරකරු වන දෙවන පාර්ශවය විසින් උත්තර බඳිමින් මොහුගේ සේවය අවසන් කර නොමැති බව දන්වා ඇති බවත්, මාස 3ක් ඇතුළත විනය පරීක්ෂණය අවසන් කරන ලෙසට නියම කරන බවට කාර්ය සටහනේ සඳහන්ව ඇති බවත්, සාක්ෂි මගින් පෙනී යයි. කෙසේ වෙතත් එකී කම්කරු විනිශ්චය සභා නඩුව 2004.02.12 දින කැඳවන ලද අවස්ථාවේ පළමු පාර්ශවය විසින් ප්‍රති උත්තර ප්‍රකාශය ගොනු කර ඇත. එහෙත් ඉල්ලුම්කරු විසින් විනය පරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු කරුණක් කම්කරු විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇති බවක් කාර්ය සටහන අනුව පෙනී නොයයි. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් තම නඩුව ඉදිරියට ගෙන යාමේ පියවර ගෙන ඇති බව පැහැදිලිය. මේ ආකාරයෙන් එම කම්කරු විනිශ්චය සභා නඩුව පියවරෙන් පියවර ඉදිරියට ගොස් කම්කරු විනිශ්චය සභාවේ විනිසුරුවරයා විසින් 2004.12.09 වන දින අතුරු නියෝගයක් නිකුත් කරමින් අනිකුත් කරුණු අතර සේවය අවසන් කිරීමක් සිදු වී නොමැති හෙයින්, කාර්මික ආරවුල් පනතේ 31 (B1) වගන්තිය යටතේ නඩුවක් පවරා පවත්වාගෙන යාමට නොහැකිය යන පදනම මත ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කර ඇත. කෙසේ වෙතත් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් විනය පියවර කඩිනම් කොට රැකියාව සම්බන්ධයෙන් මාස 6ක් ඇතුළත තීරණයක් ගත යුතු බවත්, එසේ නොකළහොත් අනුමිත ලෙස සේවය අවසන් කිරීමක් ලෙස සළකා නැවත නඩු පැවරීමේ අයිතිය ද රඳවා තබන බව ද තව දුරටත් එකී නියෝගයේ සඳහන් කර ඇත.

අනතුරුව දෙවන පාර්ශවය විසින් විනය පරීක්ෂණයක් පවත්වා 2005 මාර්තු 01 වන දින සිට සේවය කඩවීමකින් තොරව මෙම සේවක තැන වන පළමු පාර්ශ්වය සේවයේ පිහිටුවා ඇති අතර පසු පඩි ලබා දීමක් නොමැත. ඒ අනුව පළමු පාර්ශ්වය සේවයට වාර්තා කර සේවය කර අනතුරුව 2015 ජූලි 15 වන දින ඔහු සිය කැමැත්තෙන් ඉල්ලා අස් වී ඇති බව සාක්ෂි මගින් තහවුරු වී ඇත. ඒ තත්වය එසේ තිබිය දී මා වෙත යොමු කරන ලද යොමු කිරීම අනුව විසඳීමට ඇති මූලික කරුණු සම්බන්ධයෙන් සළකා බලමු.

"සේවය අත්හිටුවීම විනය පරීක්ෂණයක් පවත්වා තීරණ ගැනීම සඳහා මාස දහ අටක කාලයක් ගත වීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එසේ වූයේ නම් එම කාලය සඳහා අදාළ හිඟ වැටුප් කම්කරු දීමනා හා කොටස් ලාභ දීමනා ඔහුට හිමි විය යුතුද? නැතහොත් හිමි විය යුතු වෙනත් සහන මොනවාද යන්න වේ."

පළමුව විනය පරීක්ෂණය පවත්වා තීරණයක් ගැනීම සඳහා මාස දහ අටක කාලයක් ගත වීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න සලකා බලමු. මාස දහ අටක කාලය ගත වීම දෙපාර්ශ්වයම පිළිගත් කරුණකි. ඉහතින් දක්වා ඇති සාක්ෂි සළකා බැලීමේ දී මෙම තැනැත්තාගේ සේවය 2003.09.08 වන දින තහනමට ලක් කිරීමෙන් පසු 2003.11.16 වන දින වන විට විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව පැහැදිලි වේ. එය දෙපාර්ශ්වය විසින් පිළිගත් කරුණු වේ. 2003.11.07 වන දින පළමු පාර්ශ්වය කම්කරු විනිශ්චය සභාවේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. 2003.12.09 වන දින වග උත්තරකරුට උත්තර බැඳීම සඳහා අධිකරණය කැඳවා ඇත. එතැන් පටන් 2004.12.09 වන දින තෙක් පළමු පාර්ශ්වය විසින් ගොනු කරන ලද නඩුව කම්කරු විනිශ්චය සභාවේ පවත්වාගෙන ගොස් ඇති බව තහවුරු වේ. එසේ නම් මාස 18 ක කාලයක් ප්‍රමාදය සඳහා පසුබිම ගොඩ නගා ඇත්තේ කවුරුන් විසින්ද යන ප්‍රශ්නය පැන නැගේ. පළමු පාර්ශ්වයේ අවශ්‍යතාවය මත කම්කරු විනිශ්චය සභාවට ඉල්ලීමක් කිරීම තුළ විනය පරීක්ෂණය පවත්වාගෙන යාමේ අවස්ථාව තමන් විසින්ම නවතා ගැනීමට කටයුතු කර ඇති බව පැහැදිලිය. 2004.12.09 වන දින අංක 23/ කු/ 8099/ 2003 දරන අතුරු නියෝගය මඟින් කම්කරු විනිශ්චය සභා නඩුව නිෂ්ප්‍රභා කිරීමත් සමඟම දෙවන පාර්ශවය විසින් වහාම විනය පරීක්ෂණයක් පවත්වා මෙම කරුණ සම්බන්ධයෙන් නිගමනයකට එළඹී ඇත. විනය පරීක්ෂණයේ කටයුතු ඇනහිටීම සිදු වී ඇත්තේ, පළමු පාර්ශ්වය විසින් ගොනු කර පවත්වාගෙන ගිය කම්කරු විනිශ්චය සභා නඩුව නිසා බව පැහැදිලි කරුණකි. කරුණු මෙසේ හෙයින් විනය පරීක්ෂණය පවත්වා නිගමනයකට එළඹීම සඳහා මාස දහ අටක කාලයක් ගත කිරීම සම්බන්ධයෙන්, දෙවන පාර්ශවයට එරෙහිව චෝදනා කිරීමට යුක්ති සහගත හේතුවක් ඇති බව පෙනී නොයයි. පළමු පාර්ශ්වය විසින්ම් තමාගේ සිය කැමැත්තට අනුව ගොඩනගන ලද නෛතික ක්‍රියාදමය හේතුකොටගෙන මෙම මාස දහඅටක කාලය ගතවී ඇති බව ඉතාමත් පැහැදිලි බව පෙනී නොයයි. එසේ නම්, දෙවන පාර්ශ්වය විසින් විනය පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගැනීම සඳහා මාස දහ අටක කාලයක් ගත කිරීම හේතුවෙන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදු වූ බවට කරනු ලබන චෝදනාව පිළිගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී ඇති බවට පිළිගත නොහැක.

පළමු පාර්ශ්වයේ අවශ්‍යතාවය මත ළඟා කර ගත් දුෂ්කරතාවය සම්බන්ධ දෙවන පාර්ශ්වය වගකීමට ලක් කිරීම යුක්ති සහගත හා සාධාරණ නොවන බව මගේ නිගමනයයි. කරුණු එසේ හෙයින් දෙවන පාර්ශ්වය විසින් මාස දහ අටක කාලයක් විනය පරීක්ෂණය පවත්වා තීරණ ගැනීමට ප්‍රමාද වීම නිසා පළමු පාර්ශ්වයට අසාධාරණයක් වූ බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කරමි.

එම කාලය සඳහා අදාළ හිඟ වැටුප් කම්කරු දීමනා හා කොටස් ලාභ ඔහුට හිමි විය යුතු ද යන්න සළකා බැලිය යුත්තේ මා වෙත කර ඇති යොමු කිරීම අනුව මාස දහ අටක කාලයක් ගත වීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදු වී ඇතිනම් ය.

තව ද ඉල්ලුම්කරු විසින් A1 ලෙස ලකුණු කර ඇති පත්වීම් ලිපියේ සේවා කොන්දේසිවල දෙවන ඡේදයට අවධානය යොමු කිරීමේ දී අනිකුත් කරුණු අතර, පරීක්ෂණයක් පවතින අතරතුර වැටුප් රහිතව සේවය තහනම් කිරීමට හැකි බව

"You may also be suspended without pay pending inquiry at a company on state Tribunal level." සඳහන් වන බව ද මෙහි සඳහන් කරමි.

කම්කරු දීමනා සම්බන්ධව සලකා බැලීමේ දී පත්වීම් ලිපියේ 04 වන ඡේදයේ "C" අනු ඡේදයට අනුව, රු. 2400 ක් බැගින් වූ කම්කරු දීමනා දෙකක් මසකට හිමි වන බවත් සඳහන්ව ඇත. එකී ඉල්ලීම ලබා ගැනීම සඳහා කම්කරුවන්ගේ සේවය ලබා ගැනීමෙන් පසු ලියා ඉල්ලීමක් කළ යුතුව ඇත. සේවය තහනමට ලක් වීමෙන් පසු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට ඔහුට අවශ්‍යතාවයක් පැන නැගුන බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. කොටස් ලාභ දීමනා සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. අදාළ සාක්ෂි මඟින් තමාගේ ඉල්ලීම තහවුරු කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වන අතර පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කර නොමැති අවස්ථාවක විනිශ්චයක් ලබා දීමේ හැකියාවක් නොමැත. කෙසේ වෙතත්, විසඳීම සඳහා මා වෙත කර ඇති යොමු කිරීමට අනුව, අදාළ හිඟ වැටුප්, කම්කරු දීමනා හා කොටස් ලාභ දීමනා ඔහුට හිමි විය යුතුද යන්න තීරණය කළ යුතුව ඇත්තේ, සේවා යෝජක විසින් පරීක්ෂණයක් පවත්වා තීරණ ගැනීම සඳහා මාස දහ අටක කාලයක් ගත කිරීමෙන්, ඔහුට අසාධාරණයක් වූයේ නම් වන හෙයින් එකී ප්‍රමාදය පළමු පාර්ශ්වය විසින්ම ගොඩනඟා ඇති තත්වයක් වන හෙයින් දෙවන පාර්ශ්වයට එකී මාස දහ අටක කාලය ප්‍රමාදය සම්බන්ධයෙන් වගකීම පැවරිය නොහැකි හෙයින්ද, එවැනි හිමිකමක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් කර නොමැති හෙයින් ද කම්කරු දීමනා හා කොටස් ලාභ සම්බන්ධයෙන් හිමිකමක් ලබා ගැනීමට පළමු පාර්ශ්වයට හිමිකමක් නොමැති බව මගේ නිගමනයයි. පහත සඳහන් විනිශ්චිත නඩු තීන්දුව, සඳහන් කරමි.

MUNICIPAL COUNCIL OF COLOMBO *VS.* T. P. DE.S. MUNASINGHE and 4 other, Respondents

S. C. 485/64 - Application for a mandate in the nature of a Writ of Certiorari

The discretion which the industrial Disputes Act confers on an Arbitrator to make an award which is " just and equitable" must be exercise in a reasonable manner. The award must be "just and equitable" as between the parties to the dispute in question. The fact that one party might have encountered "hard times" because of personal circumstances for which the other party is in no way responsible is not a ground on which justice or equity requires the other party to make undue concessions.

"An arbitrator holds no licence from the Legislature to make any such award as he may please, for nothing is just and equitable which is decided by whim or caprice or by the toss of a double - headed coins."

ඉහතින් දක්වා ඇති කරුණු සියල්ල සමස්ථයක් වශයෙන් ගෙන සළකා බැලීමේ දී විනය පරීක්ෂණයක් පවත්වා නිගමන ගැනීමට මාස 18 ක කාලයක් ගත වීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයට වගකීමක් පැවරිය නොහැකි බවත්, එම තත්වය පළමු පාර්ශවය විසින් ගොඩනගා ගත් සිද්ධිමය තත්වයක් හේතු කොටගෙන සිදු වී ඇති බවත්, දෙවන පාර්ශ්වය විසින් චේතනාත්මකව විනය පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාද කිරීමත් සිදු කර නොමැති බවත් නිගමනය කරමි.

කරුණු මෙසේ හෙයින් පළමු පාර්ශ්වය විසින් ඉල්ලා ඇති පරිදි, සේවා තහනමට ලක්ව සිටි කාලය සඳහා පසු පඩි ලබා ගැනීමට ද කම්කරු දීමනා හා කොටස් ලාභ ලබා ගැනීමට ඔහුට හිමිකමක් නොමැති බව මගේ නිගමනය වේ. කොටස් ලාභ සම්බන්ධයෙන්, ඔහුට ඇති හිමිකම සම්බන්ධයෙන් හෝ එය කෙසේ නිර්ණය වන්නේ ද ආදී වශයෙන් කිසිදු ප්‍රමාණවත් සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති හෙයින් ඒ සම්බන්ධව නියෝගයක් කිරීමට ද නොහැකිය. ඒ අනුව පළමු පාර්ශ්වයට සහන ලබා ගැනීමට හිමිකමක් නොමැති බවට නිගමනය කරමි.

ඒ අනුව ප්‍රදානයක් නොකරමි.

මෙය යුක්ති සහගත හා සාධාරණ නියෝගයක් බවට ප්‍රකාශ කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2016.07.21

08 - 248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.